# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,922- 2015 ජූලි මස 03 වැනි සිකුරාදා - 2015.07.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | -- |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | -- |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | -- |
| පළාත් සභා නිවේදන ... ... ... ... | -- |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 988 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | -- |
| විවිධ දැන්වීම් ... ... ... ... | -- |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 24 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජූලි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

987- B 80962— 5,352 (2015/07)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවට කුඩා කර්මාන්ත උපදේශක/උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කුඩා කර්මාන්ත උපදේශක/උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයැදුම්පත් කැඳවනු ලැබේ.

විවෘත තරග විභාගයෙන් බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව :

| | | |
|---|---|---|
| වඩු කර්මාන්ත උපදේශක | - | 05 |
| කොහු කර්මාන්ත උපදේශක | - | 05 |
| මැටි කර්මාන්ත උපදේශක | - | 01 |

01. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කුරුණෑගල නගරයේ පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

02. *වැටුප් ක්‍රමය :*

2.1 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (iv) හි MN 1/2006 A අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය : රු. 13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040

*සටහන i*

(අ) මෙම වැටුප් ක්‍රමය වරින් වර කරනු ලබන සංශෝධන වලට යටත් වේ. මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය. මෙම තනතුරට බඳවා ගන්නා නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් පරිදි III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය. II ශ්‍රේණියට උසස් කර වසර 03 ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය. I ශ්‍රේණියට උසස් කර වසර 05 ක් ඇතුළත තුන්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.

2.2 *වයස් සීමාව.-* අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවු 18 ට නොඅඩු හා අවු 35 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. ඔවුන් සිය අයැදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

2.3 *සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අයැදුම්කරුවන්/අයැදුම්කාරියන් වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය.

(ii) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සහ 12 උප වගන්ති වල සඳහන් විධිවිධාන ද මෙම තනතුරට අදාළ වේ.

(iii) එසේ තෝරාගනු ලබන අපේක්ෂකයින් වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය. ස්ථාන මාරුවීම් වලට යටත් විය යුතු ය.

(iv) මෙම තනතුර සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝග වලටද, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහයට ද, පළාත් මුල්‍ය රීති සංග්‍රහයට ද, වයඹ පළාත් කුඩා කර්මාන්ත උපදේශක/උපදේශිකා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ද, රජය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම නිලධාරින් බැඳී සිටිය යුතු ය.

03. *අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :*

3.1 *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් හයක් (06) සමත්ව තිබීම ;

*සහ*

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

3.2 *වෘත්තීය සුදුසුකම් :*

i. *වඩු කර්මාන්ත* - රජයේ හෝ රජයේ පිළිගත් ආයතනයකින් දෑ අවුරුදු වඩු පුහුණු සහතිකය ලබා තිබීම.

ii. කොහු සහ මැටි අංශ සඳහා රජය හෝ රජයේ පිළිගත් ආයතනයකින් මාස 06කට නොඅඩු පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.

*සැ.යු.-* ඉහත සියලු අධ්‍යාපන, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් 2015.08.03 දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතු ය.

04. *අනෙකුත් සුදුසුකම් :*

4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

4.2 තරග විභාගයට පෙනී සිටින අයැදුම්කරුවන් අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (ග්‍රාම නිලධාරීන් විසින් සහතික කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කර නිකුත් කරනු ලබන සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය.)

4.3 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

4.4 තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

05. *බඳවා ගැනීමේ ක්‍රමය*.- වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පවත්වනු ලබන පැය 02ක සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණයක් ද අදළ වෘත්තීය පිළිබඳ පැය 02ක න්‍යායික හා පැය 03 ක ප්‍රායෝගික පරීක්ෂණයක ප්‍රතිඵල මත එම විභාගයෙන් වැඩිම ලකුණු ලබා ගන්නා අය සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයකින් පසුව කුඩා කර්මාන්ත උපදේශක/උපදේශිකා III වන ශ්‍රේණියට බඳවා ගැනේ. (වඩු කර්මාන්තය සඳහා ජාතික මට්ටමේ අවසන් විභාග පවත්වා සහතික ලබා දී ඇති බැවින් ඔවුන් සඳහා විෂය දැනුම හා ප්‍රායෝගික දැනුම පරීක්ෂා කිරීම අවශ්‍ය නොවන අතර ඔවුන් සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතු ය.) කුඩා කර්මාන්ත උපදේශක/උපදේශිකා III වන ශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50%ක් විවෘත තරග විභාගය මඟින් ද, 50%ක් සීමිත තරග විභාගය මඟින් ද රජයේ සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයන් බඳවා ගැනීම මඟින් ද පුරවනු ලැබේ. පුරප්පාඩු පිරවීමේ දී අභ්‍යන්තර බඳවා ගැනීමට ප්‍රමාණවත් අයදුම්කරුවන් නොමැති නම් ඉතිරි සියළුම පුරප්පාඩු බාහිර අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ.

06. *විභාග ක්‍රමය*.- විභාගය, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

*විෂයයන්*.-

(i) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය - කාලය පැය 02

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික, ආගමික හා සංස්කෘතික අංගයන් ඇතුළත් වන සේ අයැදුම්කරුවන්ගේ සාමාන්‍ය බුද්ධිය හඳුනා ගැනීම සඳහා සකස් කළ ප්‍රශ්න පත්‍රයකි. (සාමාන්‍ය දැනීම ලකුණු 50, බුද්ධි පරීක්ෂණය ලකුණු 50, එකතුව 100)

කොහු හා මැටි උපදේශක තනතුරු සඳහා අයදුම්කරන අයදුම් කරුවන් සඳහා.-

(ii) න්‍යායික පරීක්ෂණය :

කොහු හා මැටි පුහුණු ලාභීන්ගේ න්‍යායික දැනුම මැන බැලීම සඳහා අනුමත විෂයය නිර්දේශයට අනුව සකස් කළ පැය 02ක ලිඛිත ප්‍රශ්ණ පත්‍රයකි. ලකුණු 100 යි.

*කොහු කර්මාන්ත පිළිබඳ න්‍යායික දැනුම :*

* පොල් ලෙලි හඳුන්වා දීම
* කොහු සකස් කිරීම, කොහු වර්ග හඳුනා ගැනීම
* ලණු වර්ග සැකසීම
* විවිධ නිෂ්පාදන හඳුනා ගැනීම (මුසුන්, පාපිසි, පැදුරු, ගෘහ උපකරණ)
* ඩයි වර්ග හැඳින්වීම හා ඩයි කරන ක්‍රම හැඳින්වීම
* වියමන් ක්‍රම හැඳින්වීම
* පාපිසි වර්ග හැඳින්වීම
* මෝස්තර නිර්මාණය
* අලංකරණ ක්‍රම හැඳින්වීම

*මැටි කර්මාන්ත පිළිබඳ න්‍යායික දැනුම :*

* මැටි හඳුන්වා දීම
* මැටි පිළිබඳව රසායනික විශ්ලේෂණය
* මැටි හා සෙරමික් මිශ්‍රණ හඳුන්වා දීම
* යන්ත්‍ර උපකරණ හැඳින්වීම
* නිෂ්පාදන ක්‍රම හඳුන්වා දීම
* විවිධ මැටි භාණ්ඩ නිෂ්පාදනය
* අලංකරණය
* මෝස්තර ඇඳීම

(iii) ප්‍රායෝගික පරීක්ෂණය :

ඉහත (ii) සඳහන් පුහුණු ලාභීන් තමුන් විසින් හදරා ඇති ක්ෂේත්‍ර අනුව නිර්මාණ හෝ නිර්මාණ කීපයක් ඉදිරිපත් කළ යුතු ය.

*කොහු කර්මාන්ත පිළිබඳ ප්‍රායෝගික දැනුම :*

කොහු අංශයේ ඇස්තමේන්තු සැකසීම, මෝස්තර නිර්මාණය, කොහු සැකසීම, භාණ්ඩ නිෂ්පාදනය.

*මැටි කර්මාන්ත පිළිබඳ ප්‍රායෝගික දැනුම :*

මැටි කර්මාන්ත අංශයේ උපකරණ හා යන්ත්‍ර හඳුනා ගැනීම, මෝස්තර ඇඳීම, ඉදිකිරීම, පිලිස්සීම, අලංකරණය

*සැ.යු.*- බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන්නේ එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගතහොත් පමණි.

07. විභාග ගාස්තු වශයෙන් රු. 500 ක් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 2003-02-13 දරන ආදායම් ගිණුමට බැරවන පරිදි තමුන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද ව.ප.ස.මු/2 ලදුපත අයැදුම්පතට අමුණා එවිය යුතු ය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැලකිය යුතු ය.

08. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

8.1 මෙම නිවේදනයේ පහලින් ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙ. මී. 21 x 29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 05 තෙක් පළමු පිටුවට ද, 06 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටු වලට ද ඇතුළත් වන සේ අයැදුම්පත සකස් කර ගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයැදුම්පත්‍රය 2015.08.03 දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයැදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ "කුඩා කර්මාන්ත උපදේශක/උපදේශිකා III ශ්‍රේණියට බඳවා ගැනීම - 2015" යනුවෙන් සඳහන් කළ යුතු ය . (දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතු වේ.)

8.2 *අත්සන සහතික කිරීම*.-මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස් වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු හෝ රු. 2,40,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.

09. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2015.08.03 වේ.

10. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම්වලට අනුකූල නොවන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය. අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා අදාළ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙකුම අදාළ සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ.

11. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය*.- අපේක්ෂකයන් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතු ය.

(1) පුද්ගලයින් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ජාතික හැඳුනුම්පත,

(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සටහන*.- විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත්වන අපේක්ෂකයින් විභාගයට සුදුසු අයවලුන් ලෙස සලකනු නොලැබේ.

12. යම්කිසි අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට පෙර නොලැබුණහොත්, ඒ බව වහාම "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට දැන්විය යුතු ය. එසේ දැනුම් දී පහත විස්තර ඉදිරිපත් කළ යුතු ය.

*(අ)* විභාගයේ නම :————.
*(ආ)* අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය :————.
*(ඇ)* අයදුම්පත යොමු කළ ලිපිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය හා දිනය :————.

13. යම් අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම කරනු ලැබේ.

14. දැනට වාර්තා වී ඇති පුරප්පාඩු හා ඉදිරියේ දී ඇතිවන පුරප්පාඩු මෙම විභාගයෙන් සමත් අයවලුන් සිටීනම් එම අයගෙන් පිරවීම සම්බන්ධයෙන් හා අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණක් හෝ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කාන්ති වේහැල්ල,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

2015 ජූනි මස 18 වැනි දින,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල,
037-2233769.

ආදර්ශ අයදුම් පත්‍රය

විභාග අංකය : [ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවට කුඩා කර්මාන්ත උපදේශක/උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015**

1. 1.1 මුල'කුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.2 මුල'කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

2. 2.1 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.

2.2 ස්ථිර ලිපිනය :————.

2.3 දුරකථන අංකය : පෞද්ගලික :————, රාජකාරී :————.

3. ස්ත්‍රී පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : [ ] පුරුෂ : [ ]

4. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ කොටුව තුළ ✓ ලකුණ යොදන්න.)

සිංහල : [ ] දෙමළ : [ ] ඉංග්‍රීසි : [ ]

5. උපන් දිනය : වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

5.1 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2015.08.03 දිනට වයස :

අවුරුදු : [ | | | ] මාස : [ | ] දින : [ | ]

06. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3.1 යටතේ) :

*(අ)* අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය :

පළමුවර ෘ වර්ෂය :————. දෙවනවර ෘ වර්ෂය :————.
විභාග අංකය :————. විභාග අංකය :————.

| විෂයය | ලබා ඇති සාමාර්ථය | | විෂයය | ලබා ඇති සාමාර්ථය | |
|---|---|---|---|---|---|
| | පළමුවර | දෙවනවර | | පළමුවර | දෙවනවර |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

*(ආ)* (i) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය :————.
(ii) විභාග අංකය :————.

| විෂයය | ලබා ඇති සාමාර්ථය | විෂයය | ලබා ඇති සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |

*(ඇ)* වෘත්තීය සුදුසුකම් (නිවේදනයේ අංක 3.2 යටතේ හදාරා ඇති පාඨමාලා පිළිබඳව පැහැදිලිව සඳහන් කරන්න.) මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |

07\. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :————.
දිනය :————.
ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
|---|

08\. ..............................................වන මා විසින් මෙම අයැදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සඳහන් කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් වයඹ පළාත් සභාවේ කුඩා කර්මාන්ත උපදේශක/උපදේශිකා III ශ්‍රේණියේ තනතුරට පත්කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

***අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම***

(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයැදුම් පත්‍රය ඉදිරිපත් කරන...................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, විභාග ගාස්තු ගෙවා ඇති බව ද, අංක ...................... දරන ලදුපත අලවා ඇති බව ද, ඔහු/ඇය ........................................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ නම :————.
අත්සන :————.
තනතුර හා නිල මුද්‍රාව :————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු හෝ රු. 2,40,360කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.)

*රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය*

(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයැදුම්කරු/අයැදුම්කාරිය වන.......................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයෙකු බව ද, ඔහු/ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද, ඔහුගේ/ඇයගේ අයැදුම්පතේ දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමඟ හරි වැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බව ද මම සහතික කරමි.

__________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

07-246

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2015** | | | | | |
| ජූලි | 2015.07.03 | සිකුරාදා | 2015.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.10 | සිකුරාදා | 2015.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.17 | සිකුරාදා | 2015.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.24 | සිකුරාදා | 2015.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.30 | බ්‍රහස්පතින්දා | 2015.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2015.08.07 | සිකුරාදා | 2015.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.14 | සිකුරාදා | 2015.07.30 | බ්‍රහස්පතින්ද | දහවල් | 12.00 |
| | 2015.08.21 | සිකුරාදා | 2015.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.28 | සිකුරාදා | 2015.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2015.09.04 | සිකුරාදා | 2015.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.11 | සිකුරාදා | 2015.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.18 | සිකුරාදා | 2015.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.25 | සිකුරාදා | 2015.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
*රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.